පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනාගන්නා අගමැතිවරයෙකු වෙත පැවරීමය. 17 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යළි ක්‍රියාත්මක කොට ස්වාධීන කොමිසන් සභා බලාත්මක කිරීම, නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම ඇතුළු තවත් ප්‍රතිසංස්කරණ ගණනාවක් එමගින් විශේෂයෙන් යෝජනා කර තිබිණ.

විපක්ෂයේ පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කෙරුණේ මූලිකවම මේ යෝජනා පදනම් කරගනිමිනි. ඊට අමතරව ජනතාවට කෙටි කාලීන සහන සැලසෙන පාරිභෝගිකවාදී පොරොන්දු ප්‍රමාණයක්ද එයට ඇතුළත් කරනු ලැබීමෙන් පසු 'දින 100 වැඩ සටහන' මෙයෙන් එය ජනතාව අතට පත් කරනු ලැබීය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙසින් ඉකුත් 24වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ දින 100 වැඩ සටහනේ වූ දේශපාලන ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවයි. හෙවත් ජනතා න්‍යාය පත්‍රයයි. එය අප්‍රේල් නවය සහ දහය දෙදින සාකච්ඡාවට ගෙන සම්මත කරගැනීම ආණ්ඩුවේ බලාපොරොත්තුව වී තිබේ.

එහෙත් ඒ සඳහා අවශ්‍ය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්ද ප්‍රමාණය ලබාගැනීමේ අභියෝගයකට මේ වන විට ආණ්ඩුව මුහුණ පා සිටී. එය එක්තරා ආකාරයකින් විපක්ෂයේ පොදු අපේක්ෂකයෙක් මගින් මගින්ද රාජපක්ෂ පරාජය කිරීම සඳහා සකස් කෙරුණු දේශපාලන වැඩ පිළිවෙළේ තිබූ දුර්වලතාවයක ප්‍රතිපලයක් ලෙසින්ද සැළකිය හැකිය. ඒ වැඩපිළිවෙළ තුළ උපකල්පනය කෙරුණේ මගින්ද රාජපක්ෂගේ පරාජයෙන් පසු ඔහු වටා සිටි පාර්ලිමේන්තු නියෝජනය නව ජනාධිපතිවරයා වටා පෙළ ගැසෙනු ඇති බවය. එහෙත් එය එසේ සිදු නොවිය.

ජනතා නියෝජිතයන් සහ ජනතා න්‍යාය පත්‍රය

එක් අතෙකින් එම බලවේගය යහපාලනය මුල්කොට ගත් දේශපාලන ප්‍රවාහයකට එක්වීමට සුදුසු තත්ත්වයක නොවිය. එය ඒ තරමටම කුණු වී තිබිණ. අනෙක් අතට මගින්ද රාජපක්ෂද පරාජය පිළිගෙන විශ්‍රාමික ජනාධිපතිවරයෙක් ලෙස ගරු කටයුතු ජීවිතයකට අවතීර්ණ වෙනවා වෙනුවට නැවතත් ජාතිවාදය අවුළුවන දේශපාලන බලවේගයක් ලෙස මතුවෙන්නට විය. ඒ පසුබිම තුළ මගින්ද රාජපක්ෂ වටා සිටි තක්කඩි මන්ත්‍රීවරු 19 වෙනි සංශෝධනයට එරෙහිව බලවේගයක් ලෙස සංවිධානය වෙන්නට විය. ඒ අතර මගින්ද රාජපක්ෂ පරාජය කිරීමට එක්ව දැනට ආණ්ඩුව තුළ සිටින ජාතික හෙළ උරුමය වැනි දේශපාලන පක්ෂද මාස තුනකට පෙර එපා කියූ විධායක ජනාධිපති ක්‍රමය ඕනේ කියන්නට පටන් ගෙන ඇත. මෙලෙස පෙළ ගැසෙමින් තිබෙන දේශපාලන බලවේගය දැන් සූදානම් වන්නේ අප්‍රේල් 10වෙනි දින පාර්ලිමේන්තුවේදී 19වන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීමටය. හෙවත් ජනතා න්‍යාය පත්‍රය පරාජය කිරීමටය.

දැන් ජනතාව මුහුණ දී සිටින අභියෝගය වන්නේ ජනතා නියෝජිතයන් ලෙසින් පෙනී සිටින ජනතා ද්‍රෝහී තක්කඩියන්ගේ මේ උත්සාහය පරාජය කරන්නේ කෙසේද යන්නයි. ඒ වෙනුවෙන් වන ජනතා සංවාදය මේ වන විට තල කීපයක් ඔස්සේ මතුවෙමින් තිබේ. ඉදිරි දිනවලදී නැවතත් සිවිල් සංවිධාන සහ ජනමත නායකයන් ජනතා න්‍යාය පත්‍රය ඉටු කරගැනීම වෙනුවෙන් විදි බසින්නට සූදානමින් සිටිති. පුරවැසි බලය, විදියේ විරෝධය, වමේ කේන්ද්‍රය යන සංවිධාන ඉදිරි සතියේ නැවතත් ජනතාව ආමන්ත්‍රණය කිරීමට නියමිතය.

පාර්ලිමේන්තුව වට කරමු

මේ අතර රටේ නව දේශපාලන සංස්කෘතියක් අපේක්ෂාවෙන් පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කළ හැටදහසක්ෂයකට අධික ජනතාව 19වෙනි සංශෝධනය විවාදයට ගන්නා දිනවල පාර්ලිමේන්තුව වටකොට කඳවුරු බැඳ ජනතා න්‍යාය පත්‍රය සම්මත කරන්නට ඡන්දය දෙන ලෙස 'ජනතා නියෝජිතයන්ට' බලකරන උද්ඝෝෂණ ව්‍යාපාරයක් ඇරඹිය යුතු බවට වන අදහසක් සිවිල් සමාජයෙන් මතුව තිබේ. ඒ අදහස මුල් වරට ඉදිරිපත් වූයේ පසුගිය සතියේ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක කලාකරුවන් හමුවූ අවස්ථාවේදීය. අදහස ඉදිරිපත් වූයේ කලාකරුවන්ගෙනි. ජනතා විමුක්ති පෙරමුණේ නායකයා එයට කිසිදු ප්‍රතිචාරයක් පල නොකළේය.

මේ අදහස බැහැර නොකළ යුත්තක් බව පෙනෙයි. දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහාම බලයට පත් වන්මන් ආණ්ඩුවද ඒ සඳහා වන බොහෝ පියවර ගත්තේ නැවත නැවතත් සිදු කෙරුණු ජනතා බලපෑම්වලින් පසුවය. එලෙස ජනතාව නැවතත් විදි නොබසින්නට තවමත් අගවිනිසුරු ධුරයේ කටයුතු කරනු ඇත්තේ මගින්ද රාජපක්ෂගේ නීති උපදේශක මොහාන් පීරිස්ය. අල්ලස් කොමිසමේ කටයුතු සිදුවනු ඇත්තේ මගින්ද රාජපක්ෂ පත්කළ අධ්‍යක්ෂ ජෙනරාල් යටතේය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ධුරය දරනු ඇත්තේ ක්ෂණිකා ගිරිඹුරේගමය.

19 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරගන්නට හැකි වනු ඇත්තේද ජනතාව නැවතත් විදි බැස්සොත් පමණක් විය හැකිය. ජනවාරි 08වෙනිදා රට අත්කර ගත් දේශපාලන ජයග්‍රහණයට අර්ථයක් ලැබෙනු ඇත්තේ 19වෙනි ව්‍යවස්ථාව සංශෝධනය සම්මත කරගැනීමට හැකිවුවහොත් පමණකි. එසේ නොවුණු හොත් ජනවාරි 08වෙනිදා ලත් ජයග්‍රහණය මගින්ද රාජපක්ෂ පරාජය කිරීමකට පමණක් සීමා වෙනු ඇත. එබැවින් උදාවී තිබෙන මේ අවසන් අවස්ථාව අපතේ යන්නට ඉඩ නොහැරිය යුතුය.

ධනුද්ධර

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

"සාහිත්‍ය සම්භාෂණ"

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
"සාහිත්‍ය සම්භාෂණ"
එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්
සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.

අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/

කවුද බොලේ මේ කළ්‍යාණී?

වසර ගණනාවකට කලින් මා සහභාගී වූ අධ්‍යාපනික සම්මන්ත්‍රයක දී දේශනයක් පැවැත් වූ මහාචාර්ය අතුල ගිණිගේ, මිනිසා කණ්ඩායම් ලෙස ජීවත්වීමට පටන් ගැනීම, ගම්මාන සහ නගර ප්‍රදේශ බිහිවීම, ඒ ඒ ප්‍රජාවන් අතර සම්බන්ධතා ඇතිවීම යනාදී මානව විද්‍යාත්මක ඓතිහාසික කරුණු හා පරිගණක ජාල තාක්ෂණය බිහිවීම සහ අන්තර්ජාලය ඇතිවීම හා සසඳමින් අපූරු කතාවක් කළේය.

ඒ 2002 වර්ෂයයි. අන්තර්ජාලයේ අද ප්‍රබලතම මාධ්‍යය ලෙස පැවසිය හැකි සමාජ සම්බන්ධතා ජාල ඒ කාලය වෙන විට කරළියට පැමිණ නොතිබුණි.

සමාජ සම්න්ධතා ජාල යන වචනය අප සමහරෙකුට ආගන්තුක එකක් සේ දැනෙන්නට ඉඩ ඇතත්, ෆේස්බුක් යන්න උදාහරණයක් ලෙස කියූ පමණින් ඒ ආගන්තුක බව පහවී යනු ඇතැයි සිතමි.

ෆේස්බුක් යනු අද භාවිතා වෙන සමාජ සම්බන්ධතා ජාලවලින් එකක් පමණ. අනෙකුත් මේ වර්ගයේ ජාල අතර ට්විටර්, ලින්ක්ඩ්ඉන්, පී-ප්ලස්, ඉන්ස්ටග්‍රෑම් යනාදිය වේ. නමුත් ෆේස්බුක් යනු එය ඉන් වැඩිම සාමාජිකයින් සංඛ්‍යාවක් ඉන්නා, එනිසා ම, ප්‍රබලතම ජාලයයි. අද වෙන විට ෆේස්බුක් ජාලයේ සාමාජිකයෝ බිලියන එකයි කාළකටත් වඩා සිටිති. මෙය ලෝක ජනගහණයෙන් 20% තරම් වූ පිරිසකි. ඔවුන්ගෙන් මිලියන නමසියක් පමණ විශාල පිරිසක් දිනපතාව වාගේ ෆේස්බුක් සමාජ ජාලය භාවිතා කරති.

වසර 2004 දී මාක් ෂුකර්බර්ග් නමැති තරුණයා විසින් අරඹන ලද ෆෙස්බුක් සමාජ සම්බන්ධතා ජාලය සඳහා සිංහලෙන් භාවිතා වෙන නම වත්පොත යන්නයි. සමහරු මෙයට මුහුණුපොත හෙවත් මුණුපොත කියා ද කියති. ෆේස්බුක් යන්න එක වචනයක් නිසා, එය නමකි, වත්පොත හෝ මුණුපොත යන්න ද ලිවිය යුත්තේ තනි වචනයක් ලෙසිනි.

මුලින් මයිස්පේස් නම් සමාජ සම්බන්ධතා ජාලයට සම්බන්ධ වූ මා, වත්පොත් ගිනුමක් අරඹුවේ වසර 2008 දී පමණ ය. ඒ කාලය වෙන විට ලාංකිකයින් අතරින් වත්පොත වැඩියෙන් ජනප්‍රිය වී තිබුණේ ලංකාවේ සිටින්නන් අතරට වඩා ලංකාවෙන් පිටත සිටින ලාංකිකයින් අතරය. ක්‍රමක්‍රමයෙන් අන්තර්ජාල පහසුකම් වැඩිවෙනවාත් සමගම, විශේෂයෙන්ම, අන්තර්ජාල සම්බන්ධතා ඇති ජංගම දුරකතන ලංකාවේ බහුලවීමත් සමගම, මේ තත්වය කෙමෙන් වෙනස් වෙන්නට පටන් ගත්තේ ය. මේ වන විට ලංකාවේ වත්පොතේ ගිනුමක් ඇති පිරිස මිලියන තුනක් පමණ වෙන බව පැවසේ. මෙයින් අති බහුතරයක් වයස 18-35 අතර තරුණ කොටස් බවට සැකයක් නැත.

එය එසේ වුවද, වයස හැත්තෑප පහක් වන මගේ මෑණියන්ට ද, තම ජීවිතවල හයවෙන දශකය ගෙවන ඇගේ බාල සොහොයුරියන්ටද වත්පොත් ගිනුම් ඇති බව කිව යුතුයි.

වත්පොත ගැන නොදැන්නා අය වැරදීමකින් හෝ සිටී නම්, ඔවුන් ගේ දැනගැනීම පිණිස සුළු විස්තරක් මෙන්න.
වත්පොතේ ගිනුමකින් කෙරෙනුයේ ඒ හරහා ඔබ කලින් දන්නා හඳුණන අය මෙන්ම මෙතෙක් නොදන්නා අය සමගත් අන්තර්ජාලය ඔස්සේ අතතය මිතුරු සම්බන්ධතා පවත්වාගෙන යෑමයි. එමගින් එකිනෙකා ගේ තොරතුරු, අදහස්, ඡායාරූප යනාදිය තමන්ට රිසි පරිදි බෙදා හදා ගත හැකිවේ. මෙනිසා, නිරතුරු හමුනොවන මිතුරන් සහ ඥාතීන් සමග කිට්ටු සම්බන්ධතාවක් පවත්වා ගැනීමට හැකිවේ. එපමණක් නොව, කලින් දන්නා නොහඳුණන නව මිතුරන් ඇති කර ගැනීමට ද, කලින් දැන සිටි නමුත් විවිධ හේතු නිසා දුරස් වී සම්බන්ධතා නැති වී ගිය පැරණි මිතුරන් සහ ඥාතීන් ද නැවත අතතය්‍ව මුණ ගැසීමට ද හැකිවේ.

මේ අනුව බලන කල, ලෝකය කුඩා වී විශ්ව ගම්මානයක් බිහි වී ඇත යන අදහසට මේ සමාජ සම්බන්ධතා ජාල මගින් සපයා ඇත්තේ නොබිඳිය හැකි තර්කයකි.

සාමාන්‍ය ජීවිතයේ දී සමාජයේ අනෙකුත් අය හා හැසිරෙන ආකාරය අනුව මනුෂ්‍යයින් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. එක් කොටසක් සමාජශීලී හෙවත් බහිර්වර්තක පුද්ගලයින් ය. අනෙක් කොටස සමාජ ආශ්‍රය එතරම් ප්‍රිය නොකරණ, තමන් ගේ පාඩුවේ නිහඬව සිටීමට වැඩි කැමත්තක් දක්වන අන්තර්වර්තික පිරිස ය.

වත්පොත වැනි සමාජ ජාල සම්බන්ධයෙන් ද, ඉහත මූලික මිනිස් කොට්ටාශ දෙකට අයත් පුද්ගලයින් ගේ හැසිරීම දෙ ආකාර වේ. කෙටියෙන් කියතොත්, සමාජ ජාල භාවිතා කරන්නේ, ඒ හරහා වත්මන් මිතුරන් සමග තම තොරතුරු බෙදා ගන්නේ, අළුත් මිතුරන් හා

සබඳකම් ඇති කර ගන්නේ පෙර කී සමාජශීලී කණ්ඩායමේ පිරිස් ය. අන්තර්වර්තිකයෝ බහුතරයක් මේ සමාජ සම්බන්ධතා ජාලාවලින් මුළුමණින් ම ඈත් වී සිටිති. විවිධ හේතු නිසා, නොකරම බැරි කමට, ඒ හා සම්බන්ධ වෙන අය වෙනුවෙන් ඔවුන් ද, ඒ සම්බන්ධ කටයුතු අවම වෙටෙමේ තබා ගැනීම සාමාන්‍ය සිරිතයි.

දශක කිහිපයක් තිස්සේ මා හොඳින් හඳුණන සාමා මේ කණ්ඩායම් දෙකේ සංකලනයක් යැයි කිව හැක. සැබෑ ජීවිතයේ දී කොතරම් සමාජශීලී වුවත්, තම සම වයසේ මිතුරු මිතුරියන් සැම දෙනාම පාහේ වත්පොත් ගිනුම් අරඹා තොරතුරු නුවමාරු කරගනිමින් සතුටක් ලැබුවද, ඒ ගැන විහිළුවකට හෝ සිතුවේ ඇය නොවේ.
"අනේ මට නම් ඕනෑ නෑ මගේ ෆොටෝ එක එක්කෙනාට බලන්න ඉන්ටර්නෙට් එක දන්න. කොහොමටත් ඔය ෆේස් බුක් එක කියන්නේ ඕපාදූප හොයන අයට හොඳ තැනක් විතරයි!" මේ සම්බන්ධයෙන් ඇගේ මතය එය විය.

වත්පොතේ ගිනුමක් අළුතින් පටන් ගන්නා අයට, ඒ මොහොතේ ම කළ හැකි එක් දෙයක් වෙනුයේ, තම විද්‍යුත් තැපැල් ගිනුමේ විද්‍යුත් ලිපියන් ඇති සියළු දෙනාට ම එක්වර විද්‍යුත් ලිපියක් යවමින් තමන් සමග වත්පොත තුළින් සම්බන්ධවෙන ලෙස ඉල්ලා සිටීමයි. මෙය ස්වයංක්‍රීයව මෙන් සිදුවෙන්නකි.

තමන් හොඳින් දන්නා හඳුණන අයගෙන් මේ ආකාරයේ ඉල්ලීම් සාමාට ඕනෑතරම් ලැබී ඇත. ඒ සැම විටම ඇය කළේ, ඒවා නොසලකා හැරීමයි. වත්පොත යනු ඇයට දිගින් දිගටම ස්වයංවාරණ කලාපයක් ම විය.

එක් දිනක් උදෑසන තම විද්‍යුත් තැපැල් ගොනුව පරීක්ෂා කිරීමේදී සාමා දුටුවේ තවත් එවැනි ඉල්ලීමක් ලැබී ඇති බවයි. කලකට පසු ලැබුණු මේ ඉල්ලීම එවා තිබුණේ කළ්‍යාණි නමැත්තියක විසිනි.

සාමාට එක්වරම හිතට නැගුණු ප්‍රශ්ණය වූයේ "කවුද බොලේ මේ කළ්‍යාණී" යන්නයි.
තමන් වෙසෙන සිඩ්නි නගරය අවට දන්නා කියන කළ්‍යාණි කෙනෙක් නැත.
ලංකාවේ සේවය කළ ස්ථානයකවත් ආශ්‍රය කළ කළ්‍යාණියෙක් නැත.
දශක කිහිපයකට පෙර තමන් ඉගෙන ගත් විශ්ව විද්‍යාලයේ මිතුරියන් අතරද කළ්‍යාණියක් ගැන සාමාට සිතා ගත නොහැක.

"කවුද බොලේ මේ කළ්‍යාණී?"

එදින රාත්‍රියේ ලංකාවේ සිට තම මෑණියන්ගෙන් සාමාට ලැබුණු දුරකතන ඇමතුමකින් පසු සියළුම පැහැදිලි විය.
තමන් වත්පොතේ ගිනුමක් ඇරඹූ බවත්, සාමාට ද ඒ හරහා තමන් සමග සම්බන්ධ වෙන ලෙසත් ඉල්ලන ඒ විද්‍යුත් ලිපිය ස්වයංක්‍රීයව එවා තිබුණේ සාමා ගේ මෑණියන් වන කළ්‍යාණි ගේ වත්පොත් ගිනුමෙනි!

දියණියට පෙර මෑණියන් වත්පොත දික්විජය කර තිබුණි.

වත්පොතේ ගිනුමක් ඇරඹූ සම වයසේ කළ්‍යාණියක් ගැන සිතමින් සිටි සාමාට තම මෑණියන් ගේ නම ද කළ්‍යාණි බව අමතක වීම එක අතකට පුදුමයක් නොවේ.